# කෘෂිකර්මයට ත්‍රිපිටකයෙන් ලැබෙන තැන

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක
**බෝගොඩ විමලවංස හිමි**

කෘෂිකර්මයේ උත්පත්තිය හා එය මිනිසාට අවශ්‍ය වූයේ ඇයිදැයි අපි පළමුව විමසා බලමු. බෞද්ධ සාහිත්‍යයේ දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ ලෝකයේ ප්‍රභවය ගැන ඉතා පුළුල් විග්‍රහයක් කර ඇත. සඳහිරු නැති ලෝකයක ස්ත්‍රී පුරුෂ භේදයක් නොවූ සත්ත්වයා ලොවට පහළවූ බවත් ඔවුන්ගේ ආහාරය වශයෙන් රස පොළොව පහළ වූ බවත් ඔවුන්ගේ ආශාවන්ගේ අසීමිත භාවය නිසා එය අතුරුදහන් වූ බවත් ඉන්පසු ක්‍රමයෙන් භූමිපටකය, බදලතාව හා ඇල්සහල් පහළවූ බවත් එහි සඳහන් වේ. '' අකට්ඨපාකො සාලි අකණොඅථුසො සුද්ධො සුගන්ධො තණ්ඩුලප්ඵලො '' ආදි වශයෙන් කුඩු නැති දහයියා නැති සුවඳවත්වූ ඇල් සහල්වලින් ජීවත්වූ සත්වයාගේ අධික ආශාව නිසා කලකෝලාහල ඇතිවූ බවත් එබැවින් ආරක්ෂාව සඳහා මනා පියවරක් ගැනීමෙන් මහා සම්මත රජකු පහළවූ බවත් ඔහු හැඳින්වීමට ක්ෂත්‍රිය යන නාමය යොදගත් බවත් පෙනේ. ඛෙත්තානං අධිපති ඛො වාසෙට්ඨ ඛත්තියොත්‍වෙව '' යන්නෙන් එය අපට පැහැදිලි වේ. එසේ ඇල් සහල්වලින් ජීවත්වන සත්වයාට මෙයින් ලැබුනු ප්‍රයෝජනය ඉතාම ශ්‍රේෂ්ඨ නිසා ඒවා නරක් නොවී වැඩිකල් තබා ගැනීමට අවශ්‍ය විය. කෘෂි කර්මාන්තයට යෝග්‍ය පරිසරයක් එද තිබුණි. මුදල් ඉපයීමේ මාර්ගයක් වශයෙනුත් එකම මාර්ගය වූයේ ගොවිතැන පමණක් බව ඔවුන්ට වැටහුණි. රාජ්‍ය අනුග්‍රහයත් අවශ්‍යතාවත් නිසා ඔවුහු ගොවිතැනට බටහ. ගොවිතැන් කළහ. එයින් විශාල ලාභයක් උපයා ගත්හ. ඉන්දුනිම්න හරප්පා වැනි ශිෂ්ටාචාරවල දූනට ඇති සාධක තොරතුරුවලින් අපට එය මැනවින් වැටහී යයි.

මීළඟට අප බැලිය යුත්තේ ත්‍රිපිටකයෙන් කෘෂි කර්මය කෙතරම් දුරට අගය කළාද යන්නය. භාරත දේශයේ ඉතා උසස්ම වංශ දෙකක් වූ ශාක්‍ය කෝලිය වංශ දෙක එද සමාජයේ උසස් තත්ත්වයේලා ගැනුණු බව බෞද්ධ සාහිත්‍යයෙහි දක්වෙයි. එම නිසාම එද සමාජය සහමුලින්ම වාගේ ක්ෂේත්‍රයට සම්බන්ධ වූ බව පෙනේ. සිංහහනු රජතුමාගේ පරම්පරාවේ පුතුන්ට පවා නම් තැබීමේදී මෙය ශ්‍රේෂ්ඨ අංගයක් වූ බව පෙන්. සුද්ධෝදන, (පිරිසිදු බත් ඇත්තා) අමිතෝදන (මැනිය නොහැකි බත් ඇත්තා) ධෝතෝදන (සෝදන ලද බත් ඇත්තා) සුක්කෝදන (සුදු බත් ඇත්තා) සුබොදන (කදිම බත් ඇත්තා) ආදි රාජ්‍ය පාලකයින්ගේ නම් පවා කෘෂිකර්මයට සමීප වූ බව පෙනේ. එසේම එද සුද්ධෝදන රජතුමා බෝසතුන්ට දෙවැනි වැදීම කළේද ක්ෂේත්‍රයක් අසලදීය. එකල වප් මඟුල රාජ්‍ය උත්සවයක් බවට පත් වී තිබුනු බවත් ඒ සඳහා විශාල ජනතාවක් රැස්වූ බවත් එම සිද්ධියෙන් පෙනේ. එසේම භාරත දේශයේ බුදුන් දවස තිබුනු වර්ණ භෙද ප්‍රතිපත්තිය දෙස බලන විටද බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන බෙදීම අනුව ක්ෂත්‍රියයා රටේ ජනතාවට සහල් සපයන්නා යන ශ්‍රේෂ්ඨ නාමයෙන් හඳුන්වන ලද්දේය. කෘෂි කර්මාන්තයට සමාජයේ ඉතාම උසස් ස්ථානයක් ලබාදී ඇත. කර්මාන්ත දෙවැනි ස්ථානයෙහිලා සැලකෙන අවස්ථාවක් පිළිබඳව ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී බුදුන් වදාළ දේශනාවෙන් පෙනේ. '' කතමාච ව්‍යග්ඝපජ්ජ උට්ඨානසම්පද ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො යෙන කම්මන්තේන ජීවිකං කප්පෙති යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන '' ආදි වශයෙන් ගොවිතැනට උසස් ස්ථානයක් ලබා දී ඇති බව පෙනේ. ගොවිතැන ගැන එසේ ප්‍රමුඛස්ථානයක් දෙනවා මෙන්ම ගොවිතැනට අවශ්‍ය භාණ්ඩ පිළිබඳව විග්‍රහයක්ද කසීභාරද්වාජ සූත්‍රයෙන් අපට පෙන්වා දෙයි. කසීභාරද්වාජත් බුදුන් වහන්සේත් අතර ඇතිවූ සම්මුඛ සාකච්ඡාවෙන් බුදුන් වහන්සේ ඇසූ ප්‍රශ්නයකට '' අහං ඛො සමණ කසාමිච වපාමිච කසිත්‍වාච වපිත්වාච භුඤ්ජාමි '' ශ්‍රමණය මම ගොවිතැන්කොට වළඳමි යන නිර්භීත ප්‍රකාශය ඉදිරිපත් කළේ එද ගොවිතැන කෙරෙහි ඇති ඇල්ම නිසයි. එසේම තවත් විග්‍රහකරගෙන යෑමේදී එද භාවිතා කරන ලද භාණ්ඩ පිළිබඳවද බුදුන් වහන්සේගෙන් ඇසූ පරිදි '' නඛො පන මයං පස්සාම ගොතමස්ස යුගංවා නංගලංවා ඵාලංවා පාචනංවා බලිවද්දෙවා '' අපි ගෞතමයන්ගේ නඟුලක් හෝ



6—A 081356

වියගහක් හෝ හී වැලක් හෝ කෙවිටක් හෝ ගෙරිහංක් හෝ නොදකිමුයි භාණ්ඩ පිළිබඳව මනා අව බෝධයකින් සිටි බව අපට පෙනේ. මුළු සමාජයම ගොවිතැනින්ම ජීවත්වූ නිසා බුදුන් වහන්සේගේ ධර්මදේශනාවන් පවා ඒ අනුව දෙසන ලදී. "කසීභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පඤ්චමත්තානි නඩගලසතානි පයුත්තානි හොන්ති වප්පකාලෙ" යි පන්සියයක් නඟුල් යෙද වූ බව සඳහන් වීමෙන් කෙතරම් දුරට ඒ පිළිබඳව නිරතවී සිටියාද යන්න මනාව ස්ඵුට වෙයි. එසේම මිනිසාගේ රැකියාව අනුව බුදුන් වහන්සේ ධර්මය දෙසූ බවත් එම නිසාම ධර්මය හොඳින් ශ්‍රාවක යාට වැටහුණු බවත් සඳහන් වේ.

"සද්ධා බීජං තපො වුට්ඨි පඤ්ඤා මෙ යුගනඩගලං
හිරි ඊසා මනො යොත්තං සති මෙ ඵාලපාචනං"

ඒ එක් අවස්ථාවකි. ගොවිතැනේ තිබෙන අවශ්‍ය අංග අළලාම බුදු දහමේ සරල අදහස ප්‍රකාශ කිරීම මෙම කර්මාන්තයට ප්‍රමුඛස්ථානය දීමකි. තවදුරටත් ග්‍රන්ථ පරිශීලනය කිරීමේදී සුත්තනිපාතයේ ධනිය ගෝපාල සූත්‍රයේදීත් ගොවිතැනට අවශ්‍ය අංගයක් වන ගවයන් ඇති කිරීම පිළිබඳව විස්තරයක් ඇත. ධනිය ගෝපාලයන් විසින්

"අත්ථි වසා අත්ථි ධෙනුපා — ගොධරණියො පවෙණියොපි අත්ථි
උසභොච ගවම්පතිචඅත්ථි — අථ චෙ පත්ථයසෙ"

"මට ගොන්නුද ඇත. නහඹු වස්සෝද දෙනුන්ගෙන් කිරිබොන වස්සෝද ගැබිනි දෙන්නුද" ඇති බව කීමෙන් එද ගවපට්ටියක තත්වය තේරුම් ගත හැකිය. ජල පහසුකම් ගැන උදාහරණ දක්වමින් දේශනා කරන ස්ථානයක් වශයෙන් බෞද්ධයාගේ අත් පොත ලෙස භාවිතා වන ධම්මපදයේ පණ්ඩිත වර්ගයේ ගාථාවක් අපට උදාහරණ වශයෙන් දැක්වීමට පුළුවන.

"උදකංහි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං" යනාදි ගාථාවෙන් දියාලුවෝ තමන් කැමති තැනට දිය ගෙන යත්, යන්නෙන් එද වාරිමාර්ග පිළිබඳ විග්‍රහයක් අපට පෙනේ.

සංඝ පරපුර ගැන කථා කරනවිට උන්වහන්සේලා දරන කහචීවරය ගැන නොකියාම බැරිය. මහාවග්ග පාලියේ චීවරක්ඛන්ධකයේදී ඒ පිළිබඳව වැදගත් කරුණක් ඔප්පු වේ.

"අථඛො භගවා රාජගහා යථාභිරන්තං විහරිත්වා යෙන දක්ඛිණාගිරි තෙන චාරිකං පක්කාමි. අද්දසා ඛො භගවා මගධඛෙත්තං අච්චිබද්ධං පාලිබද්ධං මරියාදබද්ධං සිඞ්ඝාටකබද්ධං, දිස්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. පස්සසි නො ත්වං ආනන්ද මගධඛෙත්තං අච්චිබද්ධං පාලිබද්ධං මරියාදබද්ධං සිඞ්ඝාටකබද්ධන්ති. එවං භන්තෙති. උස්සහසි ත්වං ආනන්ද භික්ඛූනං එවරූපානි චීවරානි සංවිදහිතුන්ති. උස්සහාමි භගවාති."

බුදුහු දක්ඛිණාගිරිය බලා චාරිකාවේ වැඩිසේක. හතරැස් ලියදි බැන්දවූ දිගින් හා පළලින් මහ මියර බැන්දවූ අතරතුර කුඩා මියර බැන්දවූ සතර හන්දි බැන්දවූ මගධ ක්ෂෙත්‍රය දුටුසේක. දැක ආනන්දය තෙපි සතරැස් ලියදි බැන්ද වූ දිගින් හා පළලින් බැදි මහමියර ඇත්තාවූ අතරතුර බැදි කුඩා මියර ඇත්තාවූ බඳනා ලද සතර හන්දි ඇත්තාවූ මගධ ක්ෂෙත්‍රය දුටුහුදැයි ආයුෂමත් ආනන්ද තෙරුන් විචාළ සේක. ස්වාමිනි එසේය, ආනන්දය තෙපි භික්ෂූන්ට මෙබඳු වූ සිවුරු (සිවුරු මෙසේ කපා මැසීම) විධාන කරන්නට උත්සාහවත් වහුද. භාග්‍යවතුන් වහන්ස උත්සාහවත් වෙමියි පිළිවදන් දුන්හ. ඇතින් ඇතට ක්‍රමානුකූලව ඇති මගධ ක්ෂෙත්‍රය දුටු බුදුන්ට එය තම ශාසන නමැති ක්ෂෙත්‍රයට සම්බන්ධකර ගැනීමට සිත්වීම පුදුමයක් නොවේ. එම නිසාම බුදුහු එය චීවරයට ඇතුලත් කරමින් එය එම ක්‍රමයටම පවත්වා ගෙන යන ලෙස දැන්වූහ. එයින් පෙනෙන කරුණක් නම් එද කුඹුරු දය දහස් ගණන් වගාකර තිබුනු බවයි. බුද්ධ චීවරයේ ඇත්තේ කුඹුරත් සැලැස්මයි. එය එතරම් උසස්කොට බුදුන්ද සලකා තිබේ.

මේ අනුව බුදුන්ගේ ධර්මය හා ගොවි කර්මාන්තය අතර සම්බන්ධය ඉතා මහත්ය. ධර්ම දේශනයේදී පවා වැඩි ජනතාවට තේරෙන ක්‍රමයට ගොවිතැන පිළිබඳ කරුණු දක්වන ධර්මය දෙසූ බවත් ශාසනයට ක්ෂෙත්‍රය ඇතුලත්කර ගත් බවත් ඉහත දැක්වූ නිදසුන්වලින් අපට පෙනේ. එම දේශනා ක්‍රමයෙන් ධර්මාවබෝධයක් ජනතාවට ලැබුන බවත් බුදු සසුනට පෙරද ගොවි කර්මාන්තය ඉතාම දියුණු වූ බවත් පසුව එය ආගම හා සම්බන්ධවී පැවතුන බවත් කිව හැකිය.

මේ සඳහා ඇසුරු කළ තැන් :—

1. අග්ගඤ්ඤ සූත්‍රය — දී. නි.
2. මහා වස්තුව.
3. කසීභාරද්වාජ සූත්‍රය.
4. සුත්ත නිපාතයේ ධනිය ගොපාල සූත්‍රය.
5. ධම්මපදය — පණ්ඩිත වර්ගය.
6. මහාවග්ගයේ — චීවරක්ඛන්ධකය.